# නව නිපැයුම් ක්ෂේත්‍රයේ අනාගත පරපුරක් බිහිකිරීමට අපගේ සේවාව ලබාගන්න

**ලොව ජයගත් නව නිපැයුම්කරුවා**
**එම්.ඒ. ඩස්මන්**

> 2017 ස්විස්ටර්ලන්තයේ ජිනීවා නුවර පැවති ලෝක නව නිපැයුම්කරුවන්ගේ ප්‍රදර්ශනයේදී ප්‍රවාහන ක්ෂේත්‍රය සඳහා 2017 වසර සඳහා ඉදිරිපත් කර තිබූ නව නිපැයුම් නිෂ්පාදනවලින් තුන්වන ස්ථානය හිමි කරගැනීමට සමත් වූ ඩස්මන් මහතා දැනට පේටන්ට් බලපත්‍ර 4ක් සඳහා අයදුම්කර ඇති අතර, ඒ සඳහා අවශ්‍ය කටයුතු ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂන් සභාව විසින් කටයුතු කරමින් සිටී. නව නිපැයුම් සඳහා ඉතා පසුගාමීව සිටින රටක් වන අප රටේ කොළඹින් කි.මී. 100ක් පමණ දුරින් පිහිටි රත්නපුර දිස්ත්‍රික්කයේ කොස්පැලවින්න ග්‍රාමයේ තම ව්‍යාපාර කටයුතු කරමින් සිටින එම්. ඒ. ඩස්මන් මහතා අද අපගේ ව්‍යාපාර පිළිසඳර සඳහා එක් වේ.

**ඔබ ගැන හැඳින්වීමක් කළොත්,**

මගේ නම එම්.ඒ. ඩස්මන්, දැනට පදිංචිව සිටින්නේ රත්නපුර කොස්පැලවින්නේ පිහිටලා තිබෙන ගෝල්ඩන් ග්‍රෝව් ගමේ. මගේ ව්‍යාපාරය මගේ නිවසට යාබදව පිහිටා තිබෙන්නේ. මම විවාහකයි, දරුවන් දෙදෙනෙකුගේ පියෙක් වගේම දැනට බිරිඳ සමඟ දරුවන් දෙදෙනා ද මගේ ව්‍යාපාර කටයුතු සඳහා සම්බන්ධ වී සිටිනවා.

ළමා කාලයේ මම සිටියේ පානදුරේ, තාත්තා සී.ටී.බී. එකේ ෆෝමන්වරයෙක් හැටියට සේවය කළා. අම්මා අපිව රැකබලාගෙන ගෙදරමයි හිටියේ. ඒ හින්දා මගේ වැඩ ගැන නිතරම සෙවිල්ලෙන් හිටියේ, අම්මා ගෙදර කටයුතු සඳහා විවිධ අවස්ථාවන්වලදී ගෙදරින් බැහැරට ගිය විට මම මගේ නංගියි, මල්ලියි කාමරයකට දාලා වහනවා. එසේ කර මම විනෝදයට කළේ වයර් කෑලි අමුණමින් බල්බ් පත්තු කරන එක, පොඩි කාලේ මගේ ලොකුම විනෝදාංශය වුණේ ඒකයි.

මගේ පියා විශ්‍රාම ගන්නා විට මම පාසලේ අටේ පන්තියේ අධ්‍යාපනය හදාරමින් හිටියේ පියාගේ විශ්‍රාම ගැනීමත් සමඟම අපි රත්නපුර පැල්මඩුල්ලේ පිහිටි මගේ මවගේ ගමේ පදිංචියට ආවා. පියා විශ්‍රාම ගියවිට අපට තිබුණ එකම ආදායම වුණේ තේ ඉඩමයි.

දවසක් මම අපේ තාත්තාගේ පොකට් එකෙන් රු 150/-ක් හොරෙන් අරන් මට අවශ්‍ය වෙලා



තිබුණු වයර්, ට්‍රාන්ස්පෝමරයක් වගේ ඉලෙක්ට්‍රොනික් කෑලි කිහිපයක් මිලදී ගත්තා. මගේ අම්මා මේ ටික දැකලා මම කරන්ට් එක වද්ද ගනියි කියලා ඒවා හැංගුවා. විදුලිය සමඟ කරන කටයුතු නිසා මම අනතුරක් කරගනී යැයි සිතා මගේ කටයුතුවලට හැමවිටම තහංචි වැටුණා. නමුත් මම මගේ විදුලි කාර්මික ශිල්පය ඉගෙන ගන්න එක නතර කලේ නැහැ. වෙසක්, පොසොන් සහ විවිධ උත්සව අවස්ථාවලදී ගමේ අයට මාව නැතිවම බැරිවුණා. ඒ කාලේ මම තොරන්වලට විවිධ ආලෝක රටා නිර්මාණයකර දුන්නා අද වගේ මතකයි.




**ඔබගේ විදුලි කාර්මික දැනුම සහ ව්‍යාපාරය වර්ධනය කරගන්නේ කෙසේද?**

මම අ.පො.ස. උසස් පෙළ අවසන් කිරීමෙන් පසුව රත්නපුර කාර්මික විද්‍යාලයේ විදුලි කාර්මික පාඨමාලාවක් හැදෑරුවා. එහිදී න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම මට ලබාගැනීමට හැකිවුණා. පාඨමාලාව අවසන් කිරීමෙන් පසුව යහළුවන්ගේ ගෙවල් වයරින්කර මුදල් ලබාගනිමින් විදුලි උපකරණ අලුත්වැඩියා කිරීම ආරම්භ කළා. ඒ හැම අවස්ථාවකම අලුත් අත්හදාබැලීම් සිදුකරන්නත් උත්සාහ කළා. මම විදුලි කාර්මික පාඨමාලාව හදාරන කාලයේ සවස් වරුවේ සහ සති අන්ත නිවාඩු දිනවල ගැරේජ් එකක වැඩට ගියා. එහිදී දවසට රු.20.00ක දීමනාවක් මට ලැබුණා. ඒ ලැබුණු රු. 20.00න් කීයක් හරි ඉතුරු කරගෙන විදුලි පරිපථ ගැන ලියවුණු පොත්පත් ගෙන ඒවා කියවා අලුත් අලුත් අත්හදා බැලීම් සිදු කළා. අවුරුදු දෙකක කාර්මික පාඨමාලාව අවසානයේ මම සති අන්තයේ සේවය කළ ගැරේජ් එකේම මට රැකියාව ලැබුණා. ඒ ආයතනයේ හිමිකරු වන ආනන්ද මහතා මාව රත්මලාන ජර්මන් ටෙක් ආයතනයේ සති අන්ත පාඨමාලාවකට ඇතුළත් කළා. ඒ සඳහා මා හට නිවාඩු සහ වැටුප් ලබාදුන්නා, ඒ ගැන මම අදටත් ඔහුට කෘතඥ වෙනවා.




ගරාජයේ අලුත්වැඩියා සඳහා පැමිණෙන වාහන අලුත්වැඩියා කිරීමේදී තවත් අත්හදා බැලීම් සිදු කළා. ඒ අනුව, වාහනවල විදුලි පරිපථවල කාලයක් යාමේදී ඔක්සයිඩ් බැඳීම නිසා ඇතිවන දෝෂවලට නිතරම විසඳුම් සෙවීමට සිදුවුණා. ඒ සඳහා මගේ ආයතනයේ ආනන්ද මහතා මට අවශ්‍ය සෑම සහයෝගයක්ම දුන්නා. ඒ කාලයේ අත්හදා බැලීමක් ලෙස මෝටර් සයිකල් සඳහා වයර් හර්නස් එක නිෂ්පාදනය කිරීමට මා හට හැකියාව ලැබුණා. මේ වනතෙක් පිටරටින් ආනයනය කරන ලද වයර් හර්නස් වෙනුවට දේශීය නිෂ්පාදනයක් ලෙසට මට ඉතා අඩු මිලට මෙම නිෂ්පාදනය එළිදක්වන්න හැකියාව ලැබුණා. විදේශයෙන් ගෙන්වන වයර් හර්නස්වලට නොදෙවෙනි නිෂ්පාදනයක් බිහිකිරීමට මෙමඟින් මට හැකිවුණා. නමුත් මේ නිෂ්පාදනය මහා පරිමාණයෙන් නිෂ්පාදනය කිරීම සඳහා මුදල් නොමැති නිසා පසුව මම තීරණය කළා විදුලි කාර්මිකයෙකු ලෙස විදෙස් ගතවී මුදල් උපයාගෙනවිත් මගේ ව්‍යාපාරය නැවත ආරම්භ කිරීමට. නමුත් ඒ සඳහා ද විවිධ බාධක ඇතිවූ නිසා විදෙස් රැකියාව ද අතහැර දැමීමට සිදුවුණා.

මේ කාලය වනවිට මම විවාහකයි. දරුවන් දෙදෙනෙකුගේ පියෙක්. රට රැකියාව ලබාගැනීම සඳහා අතේ තිබූ මුදල් වියදම් වී තිබුණා. ඒ වන විට රැකියාවෙනුත් අස්වෙලා සිටියේ. ගෙදර ආර්ථික ප්‍රශ්න දවසින් දවස වැඩිවුණා. මේ කාලයේ මාව දන්න කියන අය මගේ ගෙදරට ඇවිත් යතුරුපැදි අලුත්වැඩියා කරගත්තා. අතේ මුදල් එකතුවන ප්‍රමාණය අනුව වයර් හර්නස් සාදා මා විසින්ම සවිකර දුන්නා. ඒ මුදල්වලින් කොළඹින් අමුද්‍රව්‍ය ගෙනැවිත් බිරිඳගේ ද සහයෝගය ලබාගෙන වයර් හර්නස් නිෂ්පාදනය පොඩියට ආරම්භ කළා. මගේ නිෂ්පාදනය ගුණාත්මකභාවයෙන් උසස් නිසා ඉල්ලුම වැඩිවුණා. මේ කාලයේ මම වැඩකරපු ආනන්ද මහතා මට උපකාර කිරීමට ඉදිරිපත් වුණා. ඔහුගේ ආයතනයේ පොඩි

> අපේ රටේ සංවර්ධන සඳහා අවශ්‍ය වන සියලු අංශ ආවරණය වන පරිදි ජාතික ප්‍රතිපත්තියක් සකස්කර යුතුයි. එය රට පාලනය කරන දේශපාලන පක්ෂයේ අභිමතය පරිදි පමණක් වෙනස් කළ නොහැකි වන ලෙසයි.



> මට තිබුණ ලොකුම බාධකය වුණේ සම්මත වර්ණයෙන් යුතු වයර් ලංකාවේ වෙළෙඳපොලේ සොයාගැනීමට නොහැකිවීමයි. මම වයර් මිලදී ගෙන ඒවා සඳහා සම්මත වර්ණ ආලේපකර මගේ නිෂ්පාදන සඳහා යොදාගත්තා. මේ කටයුතත ඉතා අසීරු හා දුෂ්කර කාර්යයක් වුණා.

ඉඩප්‍රමාණයක් මාහට වෙන්කරදී මගේ වැඩ කරගැනීමට උදව් කළා.

ඒ වන විට මට තිබුණ ලොකුම බාධකය වුණේ සම්මත වර්ණයෙන් යුතු වයර් ලංකාවේ වෙළෙඳපොළේ සොයාගැනීමට නොහැකිවීමයි. මම වයර් මිලදී ගෙන ඒවා සඳහා සම්මත වර්ණ ආලේපකර මගේ නිෂ්පාදන සඳහා යොදාගත්තා. මේ කටයුත්ත ඉතා අසීරු හා දුෂ්කර කාර්යයක් වුණා. දවසක් මම ඒ.සී.එල්. කේබල් ආයතනයට ගියා. මගේ අවශ්‍යතාවය ඔවුන්ට පැහැදිලි කළා. පසුව ඔවුන් මගේ ආයතනයට පැමිණ මගේ නිෂ්පාදන පරීක්ෂාකර සෑහීමට පත් වී මා හට උපකාරයක් ලෙස සම්මත වර්ණවලින් යුතුව වෙනම නිෂ්පාදනයක් මට ලබාදීමට කාරුණික වුණා. සම්මත වර්ණයෙන් යුතු වයර් ලැබීමත් සමඟම මගේ ව්‍යාපාරයට හොඳ කලදවසක් ලැබුණා. මගේ මේ නිෂ්පාදන කටයුතු සඳහා මගේ බිරිඳ, මගේ සහෝදරයා ලොකු කැපකිරීමක් සිදු කළා. වැඩි ලාභයක් ඉතිරි කරගැනීම සඳහා අපේ පවුලේ අය සමඟ එක්ව මේ නිෂ්පාදන සිදු කළා.

එක් දිනක් මෙවැනි වයර් බෙදාහරින ලොරියක් මගේ නිවසට පැමිණ මගේ නිෂ්පාදන ලංකාව පුරා බෙදාහැරීමට කැමැත්ත පළ කළා. ඒ වෙලාවේ මමත් වෙළෙඳපොළ සොයමින් සිටි අවස්ථාවක් නිසා ඔහුගේ යෝජනාවට මම කැමති වුණා. දින සති ගෙවීගෙන යනවිට තමයි මට තේරුණේ මම උගුලකට අහුවුණු බව. මගේ නිෂ්පාදන ටික පටවගෙන ගිය ලොරියෙන් මට මුදල් වත් මගෙන් ලබාගත් නිෂ්පාදන ටිකවත් ලබාගන්න බැරිවුණා.

පසුව මගේ උත්සාහයෙන් විවිධ ප්‍රදේශවලට මගේ නිෂ්පාදන විකිණීම සඳහා කටයුතු කළා. මගේ නිෂ්පාදන තත්ත්වයෙන් වැඩිදියුණු කිරීම සඳහා පිටරටින් අමුද්‍රව්‍ය ගෙන්වීම අරඹම කළා. වැඩි තොගයක් ගෙන්වීම සඳහා අවශ්‍ය මුදල් නැති නිසා පාරිභෝගිකයන් ලබාදුන් ඇණවුම් සඳහා පමණක් අමුද්‍රව්‍ය ගෙන්වා ගත්තා.

මේ කාලය වන විට මගේ නිෂ්පදන සඳහා ඉහළ ඉල්ලුමක් තිබුණ ද වැඩිපුර නිෂ්පාදනය සඳහා ප්‍රමාණවත් මුදල් නොමැතිකම විශාල ගැටලුවක් වුණා. ඒ වනවිට මම රත්නපුර දිස්ත්‍රික් යතුරුපැදි අලුත්වැඩියා කරන්නන්ගේ සංගමයේ සාමාජිකත්වය ලබාගෙන තිබුණා. මගේ නිෂ්පාදන සඳහා නම යොදාතිබුණේ MV ඉලෙක්ට්‍රොනික්ස් ඇන්ඩ් ඉලෙක්ට්‍රිකල්ස් ලෙස නම්කර තිබුණා. මගේ පුතුන් දෙදෙනාගේ නම්වල මුල් අකුරු මේ සඳහා භාවිත කළා.

දවසක් මගේ ළඟට පැමිණි පාරිභෝගිකයකුට මා විසින් නිෂ්පාදනය කරනු ලබන වයර් හර්නස් එකක් දැමීමට උත්සාහ කළා. ඔහු එය ප්‍රතික්ෂේපකර විදේශයෙන් ගෙන්වූ එකක් කොළඹ පංචිකාවත්තෙන් මිළදී ගත් බව පවසා සවිකිරීමට මා හට ලබාදුන්නා. එය පරීක්ෂාකර බැලීමේදී මා දුටුවේ මගේ MV ඉලෙක්ට්‍රොනික්ස් ඇන්ඩ් ඉලෙක්ට්‍රිකල්ස් නම පමණක් ඉතුරු කර මා විසින් නිෂ්පාදන ඇසුරුමට ඇතුළත් කරනු ලබන විස්තර පත්‍රිකාව ඉවත්කර ආනයනය කරන ලද නිෂ්පාදනයක් ලෙස මගේ පාරිභෝගිකයකු රවටා මා විසින් විකිණීම සඳහා දුන් මගේම නිෂ්පාදනයක් ඉතා වැඩි මිලකට පංචිකාවත්තේ සිටි මගේ ගැණුම්කරුවකු විසින් පිටරටින් ආනයනය කරන ලද නිෂ්පාදනයක් ලෙස විකුණා තිබුණා. පසුව මම බුද්ධිමය දේපළ ආරක්ෂා කිරීමේ කාර්යාලයට ගොස් මගේ නිෂ්පාදනය සඳහා සහතිකයක් ලබාගත්තා.

**තාක්ෂණික අංශයේ නව නිපැයුම්කරුවකු ලෙස මෙම ක්ෂේත්‍රය තවදුරටත් දියුණු කිරීම සඳහා වන යෝජනා තිබේද?**

ප්‍රධාන කරුණ ලෙස මා දකින්නේ අපේ රටේ සංවර්ධන සඳහා අවශ්‍ය වන සියලු අංශ ආවරණය වන පරිදි ජාතික ප්‍රතිපත්තියක් සකස්කර යුතුයි. එය රට පාලනය කරන දේශපාලන පක්ෂයේ අභිමතය පරිදි පමණක් වෙනස් කළ නොහැකි වන ලෙසයි. දෙවැනි කරුණ ලෙස මම ඉදිරිපත් කරන්නේ නව නිපැයුම්කරුවන් වන අප හට මෙම නිපැයුම් කිරීම සඳහා ප්‍රමාණවත් තාක්ෂණය හා උපදෙස් ලබාගත හැකි විද්වත් මණ්ඩලයක් ඇතුළත් මධ්‍යස්ථානයක් ලබාදීමයි. එසේම, මෙම නව නිපැයුම් ක්ෂේත්‍රය පිළිබඳ අනාගත පරපුරක් බිහිකිරීම සඳහා අපි වැනි නව නිපැයුම්කරුවන්ගේ සේවාව ලබාගෙන පාසල් මට්ටමේ සිට අපේ අනාගත පරපුර මේ සඳහා යොමුකර යුතුයි. එසේම, රාජ්‍ය හා පෞද්ගලික අංශවල නිලධාරීන් දැනුවත් කිරීම සහ විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍යවලින් ප්‍රචාරණය සඳහා වැඩි ඉඩකඩක් ලබාදිය යුතුයි.

**ආර්. ඒ. ඩී.**
**අජිත් රණසිංහ**